

# මිතුරාගේ දිනපොත

*නරුමසේකරගේ දිනපොත පෙරළමින් ''ඇමතිතුමාගේ වස්තුව'' කියවා නිම කළ මට ඉදිරියට ලියා ඇත්තේ කුමක්දැයි කියවන තෙක් ඉස්පාසුවක් නොවීය. මම ඉක්මණින්ම ඊළඟ පිටුව පෙරළුයෙමි. කැපී පෙනෙන ලෙස ලොකු අකුරින් ලියා තිබුණු එහි මාතෘකාව වූයේ ''රාජ්‍ය සේවකයාගේ වස්තුව'' යි.*

## රාජ්‍ය සේවකයා ගේ වස්තුව



අචාර්ය පාලිත ගනේවත්ත

කාර්යාලයේ වැඩ අවසන්වීමට තව ඇත්තේ පැය භාගයකටත් වඩා අඩු කාලයක් බව පිංගුත්තර මහතාට වැටහී ගියේ තම කාමරයට ඇතුළු වන දොර අසළ බිත්තියේ සවිකර ඇති ඔරලෝසුව හදිසියේම නෙත ගැටුණු නිසාය. දහවල් කෑම පැයේද පවා වෙනදා මෙන් කාර්යාලයෙන් පිටත නොගිය ඔහු උඩ ලාච්චුවේ තිබූ විස්කෝතු පැකට්ටුවෙන් කිහිපයක් ගිල දමා කහට තේ කෝප්පයක් පානය කළේය. කුස ගින්නක් නොදැනෙන සේ තම සිත සතුටෙන් පිරී ඇති සැටියෙකි ඔහුට දැනෙන්නේ. ඊයේ රාත්‍රී පැවති නාගරික අමද්‍යප සමිතියේ රැස්වීම අවසානයේදී ඔහුගේ සිතට පිවිසි සතුටත් සොම්නසත් තවම ඔහුගේ සියොලගම වෙළාගෙන ඇතුවා සේ දැනේ.

ගෝරිමන්ද අමාත්‍යතුමාගේ අවංක හදවතත්, පරාර්ථකාමී හැඟීමත් සිහිකළ පිංගුත්තර කෙරෙහි ඇමතිවරයා කෙරෙහි උපන්නේ නොනැසෙන භක්ත්‍යාදරයකි. අමද්‍යප ව්‍යාපාරයේ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය ඉතිරි මුදල් සම්භාරය කෙසේ සොයා ගන්නේදැයි සිතමින් පසුගිය මාස කිහිපය තුළම ඔහු අත්වින්දේ දැඩි මානසික පීඩාවකි. ගෝරිමන්ද ඇමතිතුමාගේ ඉඩම, සංගමයට පරිත්‍යාග කිරීම තුළින් දැන් එම මුදල් සම්භාරය

> *කේතුමතී පුරයේ සිට මහජන ප්‍රවාහන සේවයේ බසයකින් විවාහ හා උප්පැන්න ලියාපදිංචි කාර්යාලයට ඒමට මෙම වැඩිහිටියා ඊයේ සිටම සුදානම් වන්නට ඇත. දුර බැහැර ගෙවා පැමිණි ඔහු යළිත් ගෙදර යවා හෙට එන්නට යයි කෙසේ කිව හැකිද?*

සොයා ගැනීමේ ගැටළුව විසඳී ඇත. කොතරම් ආශ්චර්යයක්ද? ගෝරිමන්ද අමාත්‍යවරයාගේ නිහතමානී හදවත පිළිබිඹු කරන අවංක සිනහව දැනුත් තමන්ට පෙනෙන්නා සේ පිංගුත්තරට සිතිණි. ඔහුගේ කල්පනාව බිඳුනේ තම කාමරයට හිස දමා කතා කළ උප අධ්‍යක්ෂවරයාගේ කට හඬිනි.

''මිස්ට පිංගුත්තර, හෙට මට කාර්යාලයට එන්ට ලැබෙන්නේ නැහැ. ''අසරණ සරණ'' සමිතියේ නව නිවස භාරදීමේ උත්සවයට යනවා'' විල්ගම්මුල මහතා කීවේය. ''හෙට කාර්යාලයේ වැඩ ටික ඔක්කොම ඔබට භාරයි.''

පිංගුත්තර මහතා හිස නමා එය පිළිගත් බව හැඟවූයේය. සැම දිනකම කාර්යාලය වැසීමෙන් පසුව පැය කිහිපයක් විවිධ රාජකාරී කටයුතුවල නිරත වී සිටින විල්ගම්මුල මහතා අද හරියටම කාර්යාලය වසන වේලාවටම නික්ම ගියේ හෙටට යෙදී ඇති රාජකාරී ගමනට සුදානම් වීමට ඇති නිසා යයි ප්‍රධාන ලිපිකරු පිංගුත්තර මහතා සිතුවේය.

නාගර්ජුන හා වාසුදේව යන ලිපිකරුවන් දෙදෙනා නැගිට යන්නට සූදානම් වන බව පිංගුත්තර දුටුවේය. කිසියම් රාජකාරී කටයුත්තක් කර ගැනීම සඳහා පැමිණි වැඩිහිටියෙකු තමන්ගේ වාරය පැමිණෙන තෙක් තවමත් බලා සිටින සැටි පිංගුත්තරගේ ඇස ගැටිණ. කාර්යාල කාර්ය සහායකයා වූ අභිනන්දන, තරුණ ලිපිකාරිණියක වන වාසුලදත්තා සමග කිසියම් පෝරම වගයක් පුරවමින් සිටියි. කාර්යාලය නිමවන වේලාව පසුවී විනාඩි විස්සක් පමණ ගතවී ඇතත් ඔවුන් දෙදෙනා ඉක්මණින්ම කළ යුතු රාජකාරිය හමාර කරන බව පිංගුත්තර මහතා දුටුවේය. වාසුලදත්තා මෙනෙවිය ඉදිරියෙන් හිඳ උන් හැඩිදැඩි මිනිසාගේ මුහුණ කෘතඥතා පූර්වක සිනහවකින් වැසී ඇත. මෙම කාර්යාලයේ තරුණ ලිපිකාරිය කාර්යාල වේලාව පසුවූවත් කාර්යාල කාර්ය සහායකයාගේ උදව් ඇතුව තමන්ගේ අවශ්‍යතාව ඉටුකර දීමට දරණ ප්‍රයත්නය ගැන ඔහු සතුටු වන්නා සේය.

තමන්ගේ රාජකාරිය ඉටුකර ගැනීම සඳහා තවමත් බලා සිටින වැඩිහිටියා දෙස පිංගුත්තර මහතාගේ අවධානය යොමුවිය. කාර්යාල වේලාව පසුවී අඩ පැයකටත් වඩා ගතවී ඇතත් මේ තැනැත්තා ගෙදර යවා හෙට දිනට පැමිණෙන ලෙස කියන්නට ඔහුට සිත් නොදේ. කාර්යාලය වසන්නට පෙර කිසිවකු හෝ තම අවශ්‍යතාව ඉටුකර දේය යන හැඟීම ඔහුගේ මුහුණ තුළින් දිස්වන්නාක් සේය පිංගුත්තරට හැඟුනේ.

පිංගුත්තර මහතා ඔහු ළඟට ගොස් කතා බස් කළේය. ඔහුගේ අවශ්‍යතාව කුමක්දැයි විමසා සිටියේය. බැහැපත් පෙනුමෙන් පිංගුත්තර දෙස බලා සිටි ඔහුගේ නම කුවේරරත්න බව ඔහුගේ හැඳුනුම්පත පරීක්ෂා කිරීමේදී පිංගුත්තර දුටුවේය.

කුවේරරත්නට උවමනා වී තිබුනේ ඔහුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගැනීමටය. පැරණි උප්පැන්න සහතික සහිත ලිපි ගොණු ඇතුළත් පයිල්කවර දැමූ විශාල අල්මාරිය තුළ උප්පැන්නය සෙවීමට පැය දෙකක්වත් ගතවනු ඇත. කාර්යාල කාර්ය සහායකයාද, වාසුලදත්තා මෙනෙවිය සමඟ එක්ව ලිපි ගොනු අවුස්සන හැටි පිංගුත්තරට පෙනේ. ඔහුගේ රාජකාරිය නිමවීමට තව සෑහෙන වේලාවක් ගතවනු ඇත.

''ලොකු උන්නැහෙ කොහෙ ඉඳලද ආවේ?''

''අනේ මහත්තයො කේතුමතී පුරයේ ඉඳලා.''

''දැන් කාර්යාලය වහලා හෙට එන්න.'' කියා කුවේරරත්නගේ මුහුණ දෙස බලා පැවසීමට පිංගුත්තරට සිත් නොදෙයි. ඔහු මද වේලාවක් කල්පනා කළේය.

කේතුමතී පුරයේ සිට මහජන ප්‍රවාහන සේවයේ බසයකින් විවාහ හා උප්පැන්න ලියාපදිංචි කාර්යාලයට ඒමට මෙම වැඩිහිටියා ඊයේ සිටම සුදානම් වන්නට ඇත. දුර බැහැර ගෙවා පැමිණි ඔහු යළිත් ගෙදර යවා හෙට එන්නට යයි කෙසේ කිව හැකිද? තම හිතවත් මිතුරකුගේ බිරිඳ දැඩි ලෙස අසනීප වී සිටි. අද සැන්දෑවේ ඇය බැලීමට යාමටය පිංගුත්තර බිරිඳත් සමඟ කතිකා කර ගත්තේ. දැන් දෙපැයක පමණ කාලයක් ගතකර අල්මාරිය සිසාරා උප්පැන්න සහතිකයක් සොයන්ට ගියොත් මිතුරාගේ බිරිඳ බලන්නට යාමට කාලවේලා මදිවේ.
පිංගුත්තර නිවසට දුරකථනයෙන් අමතා ජනපදකල්‍යාණී සමඟ කතාබස් කළේය. තම ඇමතුමෙන් ඇය තැති ගන්නා බව ඔහුට නොරහසකි. ලෙඩ බැලීමට යාම අදම කළ යුත්තක් බවය ඇය ඊයේ රාත්‍රියේ සිටම කියා සිටියේ.

ඉන් පැයකට පසුව හති අරිමින් උප්පැන්න සහතික සහිත පයිල් කවර අවුස්සා බලන පිංගුත්තර මහතා දෙස කුවේරරත්න බලා සිටියේ සෙනෙහස පිරුණු බැල්මකින් මුව සරසා ගෙනය.




